ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

මාධ්‍ය නිවේදනය

<u>වලෙඳෙ සහ **ආයෝජන** අවස්ථා ගවේෂණය කිරීම සඳහා ඉන්දීය ව්‍යාපාරික දූත පිරිස් ශ්‍රී ලංකාවේ සංචාරයක</u>

ඉන්දිය කර්මාන්ත සම්මේලනය (CII) සහ කොචින් වාණිජ සහ කර්මාන්ත මණ්ඩලය (CCCI) නියෝජනය කරන දස සමාජික ව්‍යාපාරික දූත පිරිස් දකෙක් 2026 ඔක්තෝබර් 12-13 දිනවල ලංකා වාණිජ මණ්ඩලය විසින් සංවිධානය කරන ලද ශ්‍රී ලංකා ආර්ථික සහ ආයෝජන සමුළුව සඳහා සහභාගී වීම සඳහා කොළඹට පැමිණියහ. මමෙ සංචාර තුළින් ශ්‍රී ලංකාව තුළ පවතින වලෙඳෙ සහ ආයෝජන අවස්ථා ගවේෂණය කිරීමට, ව්‍යාපාර-ව්‍යාපාර අතර සබඳතා ශක්තිමත් කිරීමට සහ ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ආර්ථික නියැළීම් ප්‍රවර්ධනය කිරීමට අවස්ථාව උදා විය.

2. වෛද්‍ය සේවා සහ ඖෂධ, සූර්ය බලශක්තිය, තොරතුරු තාක්ෂණය, නිෂ්පාදනය සහ පාවහන් ඇතුළු විවිධ අංශවල නියෝජිතයන්ගෙන් සමන්විත වූ CII දූත පිරිස ශ්‍රී ලංකාවේ ප්‍රධාන පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා ගණනාවක් පැවැත්වූහ. එම දූත පිරිස බලශක්ති අමාත්‍ය ගරු අනුර කරුණාතිලක මහතා; කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය ගරු චතුරංග අබේසිංහ මහතා සහ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ (BOI) සහ අපනයන සංවර්ධන මණ්ඩලයේ (EDB) ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හමු වූහ. මමෙ සාකච්ඡාවන්හිදි අන්‍යෝන්‍ය වශයෙන් උනන්දුවක් දක්වන විවිධ අංශවල ආයෝජන අවස්ථා, වලෙඳෙ කටයුතු සඳහා පවතින අවස්ථා සහ ඇති කර ගත හැකි ව්‍යාපාරික සහයෝගීතාවයන් සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලදී.

3. සෞඛ්‍ය සේවා, ලොජිස්ටික්, ගොඩනැගිලි ද්‍රව්‍ය, ව්‍යාපාරික උපදේශන, තොරතුරු තාක්ෂණය සහ සංචාරක කර්මාන්තය වැනි අංශවල නියෝජිතයන්ගෙන් සමන්විත වූ කොචින් වාණිජ සහ කර්මාන්ත මණ්ඩලයේ නියෝජිත පිරිස ද ශ්‍රී ලංකා පාර්ශවකරුවන් සමඟ විවිධ සාකච්ඡා රැසක් පැවැත්වූහ. දූත පිරිස කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය ගරු චතුරංග අබේසිංහ මහතා සහ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හමු වූහ. දූත පිරිස සහයෝගීතාවය සඳහා පවතින ව්‍යාපාරික හවුල්කාරිත්වයන් සහ අවස්ථාවන්

ගවේෂණය කිරීම සඳහා විවිධ ශ්‍රී ලංකා සමාගම් සමඟ සාකච්ඡා ද පැවැත්වීය. දූත පිරිස තම සංචාරයේ කොටසක් ලෙස ශ්‍රී ලංකාවේ කර්මාන්ත මහෙයුම් පිළිබඳ දැක බලා ගනෙ අත්දැකීම් ලබා ගැනීම සඳහා නෙලේ සහ එලිෆන්ට් හවුස් කර්මාන්ත ශාලාවන් වනෙ ද ගියහ.

4. මමෙ දූත පිරිස් දකෙ ශ්‍රී ලංකාවේ ඉන්දිය මහ කොමසාරිස් අතිගරු සන්තෝෂ් ජා මහතා ද හමු විය. එහිදී මහ කොමසාරිස්තුමා ශ්‍රී ලංකා ආර්ථිකය සහ ශ්‍රී ලංකාව තුළ ඉන්දිය ව්‍යාපාර සඳහා වර්ධනය වමින් පවතින අවස්ථාවන් සම්බන්ධයනේ සිය අදහස් ඔවුන් සමඟ බදො ගත්තේය. ඔහු ශ්‍රී ලාංකීය පාර්ශ්වකරුවන් සමඟ සිය නියැළීම් ශක්තිමත් කිරීමට, ව්‍යාපාර හවුල්කාරිත්වයන් ඇති කරගැනීමට සහ වළෙඳොම සහ ආයෝජන සඳහා පවතින අවස්ථාවන් ගවේෂණය කිරීමට එම සමාගම් දිරිමත් කළේය.

5. කොචින් මණ්ඩලයේ සංචාරය මහ කොමසාරිස් කාර්යාලය විසින් කලාපීය ව්‍යාපාරික මණ්ඩල සහ ඉන්දියාවේ විවිධ ප්‍රදේශවල සහ ඔවුන්ගේ ශ්‍රී ලාංකික පාර්ශ්වකරුවන් අතර අන්තර්ක්‍රියා සඳහා පහසුකම් සැලසීම තුළින් කලාපීය සහ උප-ජාතික මට්ටමින් ශ්‍රී ලංකාව සමඟ ආර්ථික සහ වාණිජ නියැළීම් ශක්තිමත් කිරීම සඳහා ගත්නා ප්‍රයත්නයන් හි කොටසක් ද වේ. මමෙ සන්දර්භය තුළ සිහිපත් කළ යුතු තවත් වැදගත් කරුණක් වන්නේ දකුණු ගුජරාට් වාණිජ සහ කර්මාන්ත මණ්ඩලය (SGCCI) සහ ඉන්දියානු වාණිජ මණ්ඩලයේ තමිල්නාඩු ප්‍රාන්ත කවුන්සිලය (ICC) ද මමෙ වසර මුලදී ශ්‍රී ලංකා සංචාරයන්හි නිරත වූ බවයි.

5. කේරළය සහ ශ්‍රී ලංකාව අතර වළෙඳ සහ ව්‍යාපාරික සහයෝගීතාවය ශක්තිමත් කිරීම සඳහා ශ්‍රී ලංකා ආර්ථික සහ ආයෝජන සමුළුව 2026 හා සමගාමීව කොචින් වාණිජ සහ කර්මාන්ත මණ්ඩලය සහ ලංකා වාණිජ මණ්ඩලය අතර අවබෝධතා ගිවිසුමක් ද අත්සන් තබන ලදී. මමෙ අවබෝධතා ගිවිසුම කොචින් වාණිජ සහ කර්මාන්ත මණ්ඩලයේ හිටපු සභාපති සහ විධායක කමිටු සාමාජික සී. එස්. කාර්තා මහතා සහ ලංකා වාණිජ මණ්ඩලයේ සභාපති ක්‍රිෂාන් බාලේන්ද්‍ර මහතා අතර අත්සන් තබන ලදී. මමෙ අවබෝධතා ගිවිසුමේ අරමුණ වන්නේ වඩා සමීප වාණිජ සබඳතා සහ අන්‍යෝන්‍ය වශයනේ වාසිදායි ව්‍යාපාරික අවස්ථා ප්‍රවර්ධනය කිරීම සඳහා ව්‍යාපාරික නියැළීම් වැඩි දියුණු කිරීමයි.

6. මමෙ නියෝජිත පිරිස් දකෙහේ සංචාර තුළින් ව්‍යාපාර අතර නියැළීම් සහ ආයතනික හවුල්කාරිත්වයන් තුළින් ඉන්දියා-ශ්‍රී ලංකා ආර්ථික සහ වාණිජ සබඳතා ශක්තිමත් කිරීම සඳහා ගත්නා අඛණ්ඩ ප්‍රයත්නයන් අවධාරණය කරෙේ.

***

කොළඹ
2026 ඔක්තෝබර් *15*